2021.07.10

# ප්‍රවෘත්ති නිවේදනයයි

සියලුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය

**වැලිකඩ සිරකරු සමූහ ඝාතන සිද්ධියේ ඇසින් දුටු සාක්ෂිකරුවෙකු වන සුදේශ් නන්දිමාල් සිල්වා යන අයගේ ජීවිත තර්ජන සම්බන්ධයෙන් ආරක්ෂාව තහවුරු කිරීම.**

මේ වන විටත් කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ විභාග වන HC (TAB)/ 493/19 නඩුවේ ප්‍රධාන සාක්ෂිකරුවෙකු වන සුදේශ් නන්දිමාල් සිල්වා යන අයට, නැවත වරක් ජීවිත තර්ජන එල්ල වී ඇති අතර එහි ආසන්නතම සිද්ධිය වන්නේ 2021.07.07 වන දින ඔහුගේ මාලිගාවත්ත, ලක්හිරු සෙවණ දුම්රිය මහල් නිවාසයේ පිහිටි නිවස වෙත නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු පැමිණ ඔහු යනඑන තැන් සම්බන්ධයෙන් අසල්වාසීන්ගෙන් විමසීමත් ඔහුට ඉදිරියේදී ජීවිත තර්ජනයක් සිදු කිරීමට සූදානම් වන බවට හැඟවෙන ආකාරයට එහිදී එකී නාඳුනන පුද්ගලයන් ප්‍රකාශ කිරීමත් ය.

එසේම සුදේශ් නන්දිමාල් සිල්වා දැනට වසර 15 කට පමණ පෙර පදිංචි වී සිටි ගල්කිස්ස ප්‍රදේශයේ පිහිටි ඥාති නිවාසයන්ට ද ගොස් නාඳුනන පුද්ගලයන් පිරිසක් විසින් ඔහු ගැන කරුණු සොයා තිබේ.

මේ සම්බන්ධයෙන් එදිනම (2021.07.07) දෙමටගොඩ පොලිස් ස්ථානයට CIB 1 /117/42 යොමු අංකය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එසේම එකී පැමිණිල්ල යටතේ ඉහත සිද්ධිය සම්බන්ධයෙන් තවත් දෙදෙනෙකු විසින් ප්‍රකාශ ලබා දී තිබේ. තවද මීට අදාළ එම ස්ථානයේ CCTV දර්ශන ඇතුළත් වීඩියෝපටය පොලිස් විමර්ශන සඳහා ලබා දීමට කටයුතු කරමින් සිටී.

ඒ අනුව මෙසේ පැමිණ, සුදේශ් නන්දිමාල් සිල්වා යන අයගේ ජීවිතයට අනතුරක් කිරීමට උත්සහ කරන අය කවුරුන්ද සහ ඔවුන් කාගේ උවමනාවට ක්‍රියාත්මක වන්නේ ද යන කරුණු කඩිනමින් සොයා ගෙන ඔහුගේ ජීවිත ආරක්ෂාව වහා තහවුරු කළ යුතුව ඇත.

2012 වැලිකඩ බන්ධනාගාරයේ සිදුවූ සිරකරු සමූහ ඝාතන සිද්ධියේ සාක්ෂිකරුවෙකු වීමත් රජයේ අසාධාරණ සහ අයුක්ති සහගත කටයුතු ප්‍රසිද්ධ මාධ්‍ය ඉදිරියේ විවේචනය කිරීමත් නිසා මීට පෙරද ඔහුට විවිධ තර්ජන එල්ල වී තිබූ අතර එවකට ඔහු තාවකාලිකව නැවතී සිටි මොරටුව පිහිටි ඔහුගේ සහෝදරියගේ නිවසට නාඳුනන පිරිසක් විසින් සිදු කළ වෙඩි තැබීම ද ඒ අතර වේ.